සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| මගේ අංකය / எனது இல / My No | DSD/HO/06/EP/08/Hou.2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.01.24 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

## "සෞභාග්‍යයේ දැක්ම" - සමෘද්ධි නිවාස වැඩසටහන 2022

### 01. හැඳින්වීම

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක් ලබාදීමේ තිර අදිටනින් යුතුව සමෘද්ධි ප්‍රතිලාභී පවුල් අතර නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන මාසිකව ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ නිවාස හිමි ප්‍රතිලාභීන්ගේ නිවාස වැඩි දියුණු කිරීම මෙන්ම ස්ථිර නිවසක් නොමැති ප්‍රජාවට ස්ථිර නිවසක් ඉදිකර ගැනීමටද අවස්ථාව සැලසේ.

පරිගණක වැඩසටහනක ආධාරයෙන් ලක්ෂ 19.5ක් පමණ වූ සමෘද්ධි ප්‍රතිලාභීන් අතුරින් සමෘද්ධි නිවාස ලොතරැයි ජයග්‍රාහකයින් තෝරා ගැනීම සිදු කෙරේ. මෙම ලොතරැයි දිනුම් ඇදීම මඟින් දරිද්‍රතාවයෙන් ඉතා පහල මට්ටමේ හා ආබාධිත තැනැත්තන් සහිත පවුල් කෙරෙහි ඍජු අවධානයක් යොමු කිරීමේ හැකියාව අවමය. එබැවින් ජීවත්වීමට නිවසක් නොමැති හා ආර්ථික දරිද්‍රතාවයෙන් පෙලෙන මෙවැනි සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවාස ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා එම පවුල් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සහන සැලසීමට **"සෞභාග්‍යා විශේෂ නිවාස වැඩසටහන"** 2022 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288772** |

## 1. නිවාස ලොතරැයි වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහනාධාරලාභී පවුල්වල තොරතුරු ඒකරාශී කරමින් සකස් කරන ලද ප්‍රතිලාභී දත්ත පද්ධතිය අනුසාරයෙන් පරිගණක ආශ්‍රයෙන් දිනුම් අදිනු ලබන එකම වැඩසටහන වන නිවාස ලොතරැයි දිනුම් ඇදීම මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ජයග්‍රාහකයෙකු බැගින් 2022 වර්ෂයේ සිට මසකට ජයග්‍රහණ 335ක් පිරිනමනු ලබන අතර එක් අයෙකුට රු. ලක්ෂ 2 බැගින් ලබා දෙමින් මෙම වැඩසටහන ඉදිරියටත් ක්‍රියාත්මක කරනු ඇත.

## 2. විශේෂ නිවාස වැඩසටහන (රු. ලක්ෂ 2 බැගින් ලබා දීම)

2022 වර්ෂය සඳහා මෙහි සඳහන් නිර්නායකයන්ට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් ලබා දීමට නියමිත අතර එක් නිවසකට ලබාදෙන මුදල රු. ලක්ෂ 2 කි. පෙර වර්ෂයේ නිවාස ලබා දුන් ආකාරයටම ක්‍රියාත්මක වන අතර සංශෝධන වලින් තොරව ඉතාමත් සුදුසු සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හෝ අඩු ආදායම්ලාභීන්ගේ නම්, ගම් මට්ටමින් තෝරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලයට අදාල ආකෘතියට අනුව නාමලේඛනය හා තොරතුරු ලැබීමට සැලැස්විය යුතුය. සුදුසුකම් නොලබන ප්‍රතිලාභීන් සඳහා අනුමැතිය ලබානොදෙනු ඇත.

## 3. විශේෂ නිවාස වැඩසටහන (රු. ලක්ෂ 6 බැගින් ලබාදීම )

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රතිලාභින් තුන්දෙනෙකු බැගින් තෝරා ගැනීම සිදු කළ යුතු අතර සංශෝධන සිදු නොකිරීමට වග බලා ගත යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටින ඉතාම දිළිඳු අසරණ පවුල් තෝරා ගත යුතු අතර මේ සඳහා රු. ලක්ෂ 6 බැගින් ලබා දීම සිදු කෙරේ. තවද මීට අමතරව ඉදිරිපත් වන විශේෂ ඉල්ලීම් පිළිබඳව අනුමත ප්‍රතිපාදන සීමාව තුළ පිහිටා තව දුරටත් නිවාස ලබා දීමට කටයුතු කරනු ඇත. මෙහිදී අනිවාර්යයෙන් අපගේ නිර්ණායක අනුගමනය කරමින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් හෝ අඩු ආදායම්ලාභී පවුල් තුලින් ප්‍රමුඛතාවය ලැබිය යුතුම පවුල් තෝරා ගැනීම මෙහෙදී සිදුකළ යුතු වේ. එලෙස සුදුසුකම් නොලබන ප්‍රතිලාභී හෝ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබා නොදෙනු ඇත.

## 4. වෙනත් නිවාස වැඩසටහන (රු. ලක්ෂ 2 හෝ 06 බැගින් ලබාදීම )

අභියාචනා හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් ඉදිරිපත් වන යෝජනා සඳහා විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක වන අතර එක් නිවසක් සඳහා ලබා දෙන මුදල රු. ලක්ෂ 2ක් හෝ රු. ලක්ෂ 06ක් ලෙස වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ පිහිටා කටයුතු කරනු ඇත. මේ සඳහා ඉතා අඩු නිවාස ප්‍රමාණයක් පමණක්

ලබාදිය හැකි බැවින් අත්‍යාවශ්‍ය යෝජනා පමණක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. ප්‍රතිලාභීන්ගේ හෝ අඩු ආදායම්ලාභීන්ගේ තොරතුරු සම්බන්ධයෙන් නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය සෑහීමකට පත් නොවන්නේ නම් යෝජනාව සඳහා අනුමැතිය ලබානොදෙනු ඇත.

**5. අඩක් නිමකළ නිවාස ඉදිකිරීමේ වැඩසටහන (රු. ලක්ෂයක් ලබාදීම )**

මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් නිවසක් පමණක් තෝරාගත යුතුය. මෙහිදී එක් නිවසකට ලබාදෙන මුදල රු. ලක්ෂයකි. මෙහිදී කොට්ඨාසයේ නිවාස තෝරාගැනීමේදී අන්ත දරිද්‍රතාවයෙන් පෙලෙන කුමන ආකාරයකින්වත් ඉදිරියට ගොඩනගා ගැනීමට නොහැකි අඩක් පමණක් ඉදිකරගෙන ඇති රු. ලක්ෂයක මුදලින් ගොඩ නැගීමට ප්‍රමණවත් ආකාරයේ නිවසක් තෝරා ගත යුතුය.( සමෘද්ධිලාභීන් හෝ අඩු ආදායම්ලාභීන් තෝරාගත යුතුය.)

## 02. වැඩසටහන ක්‍රියාත්මක කිරීම

**1. නිවාස ලොතරැයි වැඩසටහන**

2002 වර්ෂයේ සිට විසි වසරක් පුරාවට ක්‍රියාත්මක කරන ලද නිවාස ලොතරැයි දිණුම් ඇදීමේ වැඩසටහන නොකඩවා ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව සෑම මසකටම වරක් පරිගණක වැඩසටහන මගින් දිණුම් අදින ලද මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ජයග්‍රාහකයෙක් ලෙස තෝරා ගන්නා අතර එම ලේඛන හා මුදල් දිස්ත්‍රික්කය වෙත ලැබීමට කටයුතු කරනු ඇත. 2021 ඔක්තෝබර් මාසයේ සිට ජයග්‍රාහී නාමලේඛන සමෘද්ධි වෙබ් අඩවියෙන් බාගත හැක. එය සෑම මසකම 10-15ත් දින වලදී ලබාදෙන අතර අදාල විෂයභාර නිලධාරීන් මේ පිළිබඳව සැලකිලි මත් විය යුතුය.

ඒ අනුව මාස 03කට නොඅඩු කාලයක් තුල මෙම ජයග්‍රාහී ත්‍යාග මුදල් ප්‍රතිලාභීන් අතට පත් කළ යුතු අතර එසේ ලබාදීමට නොහැකි මුදල් ප්‍රධාන කාර්යාලයේ අරමුදල් ගිණුමට බැර කළ යුතුය. විශේෂ හේතුන් සඳහා බලය විමධ්‍ය ගත කර ඇති අතර දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල අවශ්‍ය තීරණ ගැනීමේ බලය රෙගුලාසි මාලාවට අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන් වෙත පවරා ඇත. තවද මුදල් ඉල්ලනු ලබන විශේෂ අවස්ථාවලදී ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් සෑහීමකට පත් වන්නේ නම් මුදල් නිදහස් කිරීම සිදු කළ යුතුය.

**2. විශේෂ නිවාස වැඩසටහන (රු. ලක්ෂ 2 බැගින් ලබා දීම)**

**I ක්‍රියාත්මක ක්‍රමවේදය**

- මෙහිදී ප්‍රතිලාභියාගේ ඉල්ලීම් ලිපියක් සමඟ පදිංචි නිවසේ වර්තමාන තත්ත්වය දැක්වෙන ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.

- තෝරා ගැනීම සිදු කිරීමේදී අදාල පවුල්වල සවිස්තරාත්මක තොරතුරු ගොනුවක් පවත්වාගෙන යා යුතුය.
- සමෘද්ධි නිලධාරීන්ගේ (කලාප කළමනාකරුවන් හා සංවර්ධන නිලධාරීන්ගේ) හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියෙන් ප්‍රධාන කාර්යාලයට ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු ලබාදීමෙන් පසු සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති ප්‍රතිලාභීන් සඳහා නිවාස ඉදි කිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික්ක වෙත මුදා හරිනු ලැබේ.
- ප්‍රතිලාභීන් සඳහා මුදල් නිදහස් කිරීමේදී කලාප කළමනාකරුගේ නිර්දේශය ලබා දිය යුතුය.
- තවද මෙම නිවාස ඉදිකිරීමේදී ප්‍රජා දායකත්වය හා අදාල ප්‍රදේශයේ ප්‍රභූ දායකත්වය ලබාගැනීම සුදුසු අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා ගැනීම සිදුකළ යුතුය.

**II වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම :**

| | | | |
|---|---|---|---|
| 1. | දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | - | දිස්ත්‍රික්කයේ සමස්ත වැඩසටහන පිළිබඳ අධීක්ෂණය හා මෙහෙයවීම |
| 2. | ප්‍රාදේශීය ලේකම් | - | තම බල ප්‍රදේශය තුළ අධීක්ෂණය |
| 3. | මූලස්ථාන කළමනාකරු/කළමනාකාර අධ්‍යක්ෂ/සමෘද්ධි ප්‍රජාමූල බැංකු (කලාප) කළමනාකරු | - | නියමිත පුද්ගලයින් තෝරා ගැනීමේදී නිර්දේශ ලබාදීම හා නිවාස ඉදිකිරීම හා සම්බන්ධව, පසු විපරම, අධීක්ෂණය, අදාල අංශ සමඟ සම්බන්ධීකරණය |
| 5. | සමාජ සංවර්ධන සහකාර | - | නිරන්තර පසු විපරම හා නිවාස ඉදිකිරීමේදී ගැටළු මතු වුවහොත් කළමනාකරුවන් හා ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධීකරණය හා නිවස ඉදිකිරීමේ කටයුතු අවසන් වනතුරු පූර්ණ සම්බන්ධීකරණය |
| 6. | වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී | - | නිවාස තෝරා ගැනීමේදී හා ඉදිකිරීමේදී පරිත්‍යාගශීලීන්ගේ සහයෝගය හා ප්‍රදේශ වාසීන්ගේ හා ප්‍රතිලාභී පවුලේ ශ්‍රම දායකත්වය ලබාගනිමින් නිවස ඉදි කිරීමට උපරිම සහයෝගය ලබාදීම හා නිවසේ වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු කිරීම |

**III මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරීමේ ක්‍රමවේදය :**

නිවසක් සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂ මගින් ප්‍රජාමූල බැංකුව වෙත ලබාදෙන

උපරිම මුළු මුදල - රු. 200,000/- කි.

පළමු වාරිකය - ලබාදෙන මුදලින් 50% ක්

දෙවන වාරිකය - ලබාදෙන මුදලින් 50% ක්

මෙහිදී නිවසේ මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමු වාරිකය නිදහස් කිරීමෙන් පසු නිවස ඉදිකිරීමේ ප්‍රගතිය පරීක්ෂා කොට වාර්තා කිරීමෙන් අනතුරුව දෙවන වාරිකය නිදහස් කළ යුතුය.

මෙම නිවාස ඉදිකිරීමේදී එක් නිවසක් සඳහා ලබාදෙන රු. ලක්ෂ 2 හා ප්‍රදේශයේ දානපතියන්ගේ සහයෝගයෙන් වඩා වැඩි වටිනාකමකින් යුක්තව නිවාසය ඉදිකිරීමට නිළධාරීන් කටයුතු කළයුතුය.

**3. රු. ලක්ෂ 06 නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

**I. සනාථ කර ගැනීමට අදාල නිර්ණායක**

නිවස සෑදීම සඳහා ස්ථිරව තමන් සතු ඉඩමක් තිබිය යුතුය. පවුලේ සාමාජිකයින් 4 දෙනෙකු වත් (මව, පියා, දරුවන් දෙදෙනෙකු) සිටිම අනිවාර්ය වන අතර වැන්දඹු පවුලක් වීම හෝ ආබාධිත අයෙකු පවුලේ සිටීම (විශේෂයෙන් ගෘහ මූලික පිලිබඳව සලකා බලන්න) හෝ ආර්ථික මට්ටම සලකා බැලීමේදී දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල තෝරා ගැනීම වඩාත් සුදුසුය. සුදුසුකම් සපුරාලීමට නොහැකි නිවාස යෝජනා ප්‍රතික්ෂේප විය හැකි බැවින් නිර්නායක පිළිබඳව සැලකිල්ලක් දැක්වීම අනිවාර්ය වේ.

මේ සඳහා අදියර 03ක් යටතේ දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රජාමූල බැංකුව වෙත ප්‍රතිපාදන ලබාදෙන අතර එක් නිවසක් වෙනුවෙන් ලබාදෙන මුදල රු. ලක්ෂ 06 (රු. 600,000/-) කි. එක් වාරයකදී රු. ලක්ෂය (රු.100,000/-) බැගින් පමණක් වන සේ අදියර 06ක් යටතේ ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කිරීම සුදුසුය.

**II. තෝරා ගැනීමේ ක්‍රියාවලිය**

ඉහත කරුණු සඳහා මූලිකත්වය දෙමින්, නිවසක් නොමැති, නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නොමැති නමුත් නිවස ඉදිකර ගැනීමට තමා සතු ඉඩමක් හිමි පවුලක් තෝරා ගත යුතුය. තෝරා ගැනීමෙන් අංක 01 හි නිර්ණායක යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් වන සේ තෝරාගත යුතුය. අනෙක් නිවාස ප්‍රමුඛතා පිළිවෙලට පෙළ ගස්වා තිබිය යුතුය.

**විශේෂයෙන් මෙම වැඩසටහන වෙනුවෙන් ලබාදෙන ආකෘති පත්‍රය මගින් පමණක්ම තොරතුරු ලබාදිය යුතු අතර මේ සඳහා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වගකීම දැරිය යුතු වේ.**

අදාල ආකෘති පත්‍රයෙන් තොරව එවනු ලබන යෝජනා ප්‍රතික්ෂේප කරනු ඇත. තවද විවිධ ආකෘති පත්‍ර හා විවිධ නම් වලින් එවනු ලබන යෝජනාද ප්‍රතික්ෂේප කරනු ඇත. මෙම වැඩසටහන සෞභාගයා විශේෂ නිවාස වැඩසටහන ලෙස හඳුන්වාදිය හැකිය.

විශේෂයෙන් ප්‍රජා මූල සමිති සභාපති, ලේකම්, වසමභාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, වසම අයත් කලාප කළමනාකරු, මූලස්ථාන කළමනාකරු හා ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණ සහ අධීක්ෂණය මත මෙම නිවස ඉදිකිරීම කළ යුතුය. ප්‍රතිපාදන නිදහස් කිරීමේදී රු. ලක්ෂ 05ක් (රු. 500,000/-) දක්වා කලාප/මූලස්ථාන කළමනාකරුවන්ගේ වාර්තා අනුව ප්‍රජාමූල බැංකු වෙත මුදල් නිදහස් කළ හැකි අතර අවසන් වාරිකය නිදහස් කිරීමට පෙර තාක්ෂණ නිලධාරී වාර්තාව ලබා ගත යුතුය.

III. **මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරීමේ ක්‍රමවේදය :**

මෙහිදී දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රජාමූල බැංකු වෙත එක් නිවසකට රුපියල් ලක්ෂ 02 බැගින් අදියර 03ක් යටතේ ප්‍රතිපාදන ලබා දෙන අතර 2022 අප්‍රේල්- මැයි මාසවලදී මුදල් ලබාදෙනු ඇත. ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කිරීමේදී අදියර 06 ක් යටතේ පහත පරිදි මුදල් ලබාදීම සිදු කළ යුතුය.

| අදියර | ලබාදෙන මුදල | අවසන් කළ යුතු වැඩ සීමාව |
|---|---|---|
| අදියර 01 | රු.100000.00 | වැඩ ආරම්භ කිරීම හා අත්තිවාරම සකස් කිරීම |
| අදියර 02 | රු.100000.00 | බිත්ති බැඳ අවසන් කිරීම. |
| අදියර 03 | රු.100000.00 | වහළ සෙවිලි කිරිම |
| අදියර 04 | රු.100000.00 | කපරාරුව හා තීන්ත ආලේප කිරිම, බිම සකස් කිරීම |
| අදියර 05 | රු.100000.00 | දොර ජනෙල් දමා උපකරණ සවි කිරීම. |
| අදියර 06 | රු.100000.00 | සියළු වැඩ අවසන් කොට තාක්ෂණ නිලධාරී වාර්තාව ලබා ගැනීමෙන් පසු ගෙවීම් කිරීම |

2022 සැප්තැම්බර් මස මස 15 වන දිනට පෙර නිවාස ඉදිකිරීම අවසන් කර සියළු ගෙවීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

මෙම නිවස ඉදි කිරීමේදී ප්‍රතිලාභියා සතු ඉඩමේ පිහිටීම අනුව සුදුසු නිවාස සැලසුම් එවා ඇති නිවාස ආකෘති වලට අනුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.

## 4. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය මගින් ඉදිරිපත් කරන යෝජනා

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවලින් හෙළිදරව්වූ කරන විශේෂ නිවාස අවශ්‍යතා සඳහා තොරතුරු අනාවරණයවූ විගස ඒ පිළිබඳ ඔබගේ නිලධාරීන් ලවා පරීක්ෂා කර වාර්තාවක් ප්‍රධාන කාර්යාලයට ලබාදී අවශ්‍ය පහසුකම් ලබාගැනීමට කටයුතු කළයුතු අතර එම තොරතුරු ඉදිරිපත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනය වෙත ඔබ විසින් මේ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගය පිළිබඳව දැනුවත් කළ යුතුය.

තවද ඔබ දිස්ත්‍රික්කයට අදාලව සමෘද්ධිලාභීන්ගේ නිවාස පිලිබඳව පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය වන්නේ නම් එවැනි නිවාස හිමි පවුල් පිළිබඳව අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි නිලධාරීන් දැනුවත් වී නොමැත්තේ මන්ද යන්න විශේෂයෙන් සොයාබලා ඒ සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. තම වසමේ සිටින ඉහත නිර්ණායකයන් සම්පූර්ණ කළ සමෘද්ධිලාභීන් හෝ අඩු ආදායම්ලාභීන් පිලිබඳ වාර්තා තබා ගැනීමට උපදෙස් ලබාදීම වඩාත් උචිත වේ. මෙවන් අවස්ථාවලදී සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන නායකයින්ගේ සහායද ලබාගැනීමට කටයුතු කළ යුතුය. එසේ අවශ්‍යතාවය පවතින සමෘද්ධිලාභී අඩුආදායම්ලාභී නිවාස පිලිබඳ තොරතුරු ලබාගැනීමේදී ආකෘති පත්‍ර අනුව විස්තර යාවත්කාලීන කරමින් තබා ගැනීම සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සංවර්ධන සහකාර හා කලාප කළමනාකරුවන්ගේ වගකීමක් ලෙසද සැලකිය යුතුය.

ඇතැම් අවස්ථාවල සමහර දිස්ත්‍රික්ක වසර පුරාවටම නිවාස යෝජනා සාධාරණ නොවන හේතුන් මත සංශෝධනය කිරීමට ප්‍රධාන කාර්යාලය වෙත එවීම පසුගිය වසර තුල සිදුවූ බැවින් එම අපහසුතාවය මගහරවා සාර්ථක ලෙස සෞභාග්‍යා විශේෂ නිවාස වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම නිලධාරීන්ගේ වගකීමක් වනු ඇත.

ඒ අනුව මෙම වසරේ තම දිස්ත්‍රික්කයට අයත් නිවාස යෝජනා 2022 මාර්තු 10 දිනට පෙර එකවර ලබා දිය යුතුය. වරින් වර ඉදිරිපත් කරනු ලබන නිවාස යෝජනා සඳහා දිස්ත්‍රික්කය වෙත මුදල් ලබාදීම සිදු නොකරන බව අවධාරණය කරමි.

## 5. අඩක් නිමකල නිවාස සඳහා මුදල් ලබාදීම

මෙහිදී අදාල වසම භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී හා සමාජ සංවර්ධන නිලධාරී විසින් පරික්ෂා කර බලා කොට්ඨාසය තුල ඉතාම සුදුසු පවුල තෝරාගැනීමට කටයුතු කළ යුතුය. අනතුරුව එක්වරකදී

නිදහස් කරනු ලබන රු. ලක්ෂයක මුදල උපයෝගී කරගනිමින් හා ප්‍රදේශයෙන් ලබාගත හැකි සම්පත් ඒකරාශී කරමින් නිවසේ වැඩ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

මෙහිදී විශේෂයෙන් නිවසේ අඩක් වැඩ නිමකර ඇති හා ඉතිරි කොටස සාදාගැනීමට නොහැකිව කටයුතු කරන පුද්ගලයින් පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ආර්ථික වශයෙන් දරිද්‍රතාවයෙන් පෙලෙන වැන්දඹු පවුල් හා ගැහැණු දරුවන් සිටින අනාරක්ෂිත පවුල් පිළිබඳ වැඩි අවදානයක් යොමුකර තෝරා ගැනීමට කටයුතු කිරීම ඉතා සුදුසු වේ.

තෝරාගත් නිවාස වල නිවස ඉදිකිරීමට පෙර ඡායාරූප හා නාමලේඛන පහත ආකෘතියට අනුව සකස් කර 2022.03.15 දිනට පෙර ව්‍යවසාය සංවර්ධන අංශයේ ඊ මේල් ලිපිනය වන marketing@samurdhi.gov.lk වෙත යොමු කරන්නේ නම් මැනවි. මෙම නාමලේඛන සකස් කිරීමේදී දේශපාලන අධිකාරියේ සහයෝගය ලබාගැනීමටද කටයුතු කළ යුතුය.

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ප්‍රජාමූලබැංකුව | ග්‍රා.නි. වසම | නම | ලිපිනය | හේතුව | වසමභාර නිළදාරියාගේ නම | දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |

තවද මෙම තෝරා ගන්නා සෑම නිවසකම නිවසේ පෙර තත්ත්වය හා පසු තත්ත්වය සඳහන් ඡායාරූප ඔබ භාරයේ තබා ගත යුතු අතර නිවාස විවෘත කරන අවස්ථාවේදී එම වාර්තා ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය.

මෙම ප්‍රගතිය සෑම මසකම නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බැවින් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර වලට අනුව සෑම මසකම 10 වන දිනට පෙර ව්‍යවසාය සංවර්ධන අංශයට ඊමේල් මගින් ලබාදිය යුතු බව අවධාරණය කරමි. මෙහිදී ලක්ෂ 02 නිවාස සඳහාත්, ලක්ෂ 06 නිවාස සඳහාත්, ලක්ෂයේ නිවාස සඳහාත් වෙන වෙනම ආකෘති පත්‍ර 03ක් හඳුන්වා දී ඇති අතර එමගින් ප්‍රගතිය වාර්තා කළ යුතුය. මීට අමතරව වෙනත් හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මගින් යෝජනා ඔබ දිස්ත්‍රික්කය වෙත ලබාදී තිබේනම් ලක්ෂ 02 හා ලක්ෂ 06 නිවාස වාර්තාවල පහලින් එම තොරතුරුද ඇතුලත් කර වාර්තා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

අදාල වාර්තා නිවැරදිව ඉදිරිපත් නොකරන දිස්ත්‍රික්ක හා කලාප ප්‍රජාමූල බැංකු වලට ප්‍රතිපාදන ලබා නොදීමට කටයුතු කරනු ඇත.සෑම අදියරක් අවසානයේදීම වියදම් වූ මුදල් පිළිබඳව වාර්තාවක් ලබාදෙමින් ඊලඟ අදියර සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මුදල් ඉල්ලීම කළ යුතුය.

**"සෞභාග්‍යයේ දැක්ම"** යටතේ සිදු කෙරෙන සෞභාග්‍යා සමෘද්ධි නිවාස වාසනා වැඩසටහන සාර්ථක කර ගැනීමට අදාල නිලධාරීන් මෙහෙයවීම පිළිබඳ ස්තුතිවන්ත වෙමි. මෙය ප්‍රමුඛ රාජකාරියක් ලෙස සලකා ඔබ සැමගේ සක්‍රීය දායකත්වය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි
02. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි .සං.දෙ - අ.ක.ස
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස
04. අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය) - අ.ක.ස